

පරිසර අමාත්‍යාංශය

# ඕසෝන් විත්ති

2021 දෙසැම්බර් - වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය

විද්‍යාත්මක හෙළිදරව්වට අනුව, පෘථිවි ආරක්ෂිත ඕසෝන් ස්ථරය 2000 වසරේ සිට 2% පමණ වේගයකින් ප්‍රකෘති තත්වයට පත්වෙමින් පවතින අතර මෙම සියවසේ මැද භාගය වන විට සම්පූර්ණයෙන්ම ප්‍රකෘති තත්වයට පත් කළ හැකිය. 1987 පිහිට වූ මොන්ට්‍රියල් සන්ධානය මඟින් ක්ලෝරෝෆ්ලෝරෝකාබන් (CFC) සහ අනෙකුත් ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය තහනම් කිරීම මෙම සාර්ථකත්වයේ වේගයට හේතු විය.

මොන්ට්‍රියල් සන්ධාන ගෝලීය ගිවිසුම නොතිබුනේ නම් 2065 වන විට පෘථිවියේ ඕසෝන් ස්ථරයෙන් වැඩි ප්‍රමාණයක් විනාශ වීමට ඉඩ තිබුණි. මිනිසුන්ගේ සහ අනෙකුත් සතුන්ගේ සමේ පිළිකා, ඇසේ සුද ඇතිවීම සඳහා සූර්යයාගේ හානිකර පාරජම්බුල කිරණ වලින් ඇතිවන විනාශකාරී ප්‍රතිවිපාක වලින් ඕසෝන් ස්ථරය මගින් පෘථිවියේ ජීවය ආරක්ෂා කරයි.

දැනට පවතින ඕසෝන් ක්ෂයකාරක රසායන ද්‍රව්‍යයන්ගේ විමෝචනය අඩුවීම දීර්ඝකාලීනව පැවතුනහොත්, උතුරු අර්ධගෝලයේ ආක්ටික් ඕසෝන් සිදුර 2030 වනවිට ප්‍රකෘතිමත් තත්ත්වයට පත් කළ හැකි අතර වර්ග කි.මී. මිලියන 28.4 ක ප්‍රමාණයේ උතුරු ඇමරිකාව තරම් විශාල වූ ඇන්ටාක්ටිකාවට ඉහළින් ඇති සිදුර 2060 පමණ වන විට සම්පූර්ණයෙන්ම යථා තත්ත්වයට පත් කළ හැකිය.

**2021 නොවැම්බර් 28 ආසන්න වශයෙන් වර්ග කිලෝමීටර් මිලියන 25**



**ජගත් ඕසෝන් දින ජාතික උත්සවය 2021**




**"මොන්ට්‍රියල් සන්ධානය: අපව, අපගේ ආහාර සහ එන්නත් සිසිල්ව තබයි"**

2021 ජගත් ඕසෝන් දින සැමරුම ජාතික ඕසෝන් ඒකකය විසින් මාර්ගගත ක්‍රමයට සංවිධානය කරන ලදී. අමාත්‍යාංශ නිළධාරීන්, රජයේ ජ්‍යෙෂ්ඨ නිළධාරීන් රාජ්‍ය හා පෞද්ගලික අංශය කාර්මික හා වෘත්තීය පුහුණු ආයතන වල සිසුන් සම්බන්ධ කර ගනිමින් පරිසර අමාත්‍ය ගරු මහින්ද අමරවීර මහතාගේ ප්‍රධානත්වයෙන් මාර්ගගත ක්‍රමයට පවත්වන ලදී.

පිටු අංක 04-05

# ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රයේ නව තාක්ෂණයන් හඳුන්වාදීමේ හා ධාරිතා වර්ධනය කිරීමේ වැඩසටහන්

## තාක්ෂණික ආයතන වල පුහුණු කාර්මිකයන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම

මොන්ට්‍රියල් සන්ධානය යටතේ ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රයේ භාවිතා කල ඇතැම් ශීතකාරකයන් මේ වන විට තහනම් කර ඇති අතර තවත් ශීතකාරකයන් අදියරගතව ඉවත් කරමින් පවතී. 2016 වසරේදී මොන්ට්‍රියල් සන්ධානයට සිදුකල කිගාලි සංශෝධනය හරහා ගෝලීය උණුසුම අවම කිරීම සඳහා ඇතැම් ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍යයන් වෙනුවට හදුන්වාදුන් විකල්ප රසායනයන් භාවිතය ඉදිරියේදී අවම කිරීම සිදුකරනු ඇත. ඒ අනුව කාර්මික හා වෘත්තීය පුහුණු ආයතන වල පුහුණුව ලබන සිසුන් සහ ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ පෞද්ගලික අංශයේ කාර්මිකයින් සඳහා පරිසර හිතකාමී ආකාරයට ශීතකාරක පරිහරණය කිරීම පිළිබඳව දැනුමක් ලබාදීම සහ මෙම ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා සහ තාක්ෂණය පිළිබඳ දැනුම හුවමාරුව සඳහා වැඩමුළු දිවයින පුරා පැවැත්වීම ජාතික ඕසෝන් ඒකකය මඟින් අඛණ්ඩව සිදුකරයි. ශීතකරණ ක්ෂේත්‍රයේ යහපත් සේවා පුරුදු (Good Servicing Practices in Refrigeration) පිළිබඳ වැඩමුළුව මඟින් ශීතකාරක එකතු කිරීම, නැවත භාවිතය හා ප්‍රතිචක්‍රීකරණය (Recovery Recycling and Reclamation) පිළිබඳව අදාළ පුහුණු වැඩමුළු පවත්වන ලද අතර ඇතැම් වැඩමුළු වර්තමාන කොවිඩ් තත්වය හමුවේ මාර්ගගත ක්‍රමයට පවත්වන ලදී.





## ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රයේ උපදේශකවරුන්ගේ / පුහුණු කාර්මිකයන්ගේ ධාරිතා වර්ධනය කිරීමේ වැඩමුළු පැවැත්වීම

ශීතකරණ හා වායුසමන පද්ධති සේවා හා නඩත්තු කිරීමේදී පරිසරයට මුදා හැරෙන HCFC හා HFC කාණ්ඩවලට අයත් කෘත්‍රිම ශීතකාරක ඕසෝන් ස්ථරය ක්ෂයවීමට මෙන්ම ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑමට ද හේතුකාරක වන බැවින් මේ වන විට ලොව පුරා එම උපකරණ නිෂ්පාදකයින් විසින් ඕසෝන් ක්ෂයකාරක විභවය ශූන්‍ය අගයක් හා ගෝලීය උණුසුම් විභවය අඩු දායකත්වයක් දක්වන ස්වාභාවික ශීතකාරක මඟින් ක්‍රියාකරන උපකරණ නිෂ්පාදනයට නැඹුරු වී ඇත.

එකී ශීතකාරක අතුරින් ප්‍රමුඛ ස්ථානයක් ගන්නා වූ R600a, R290 හා ඇමෝනියා වායුව වැනි ස්වාභාවික ශීතකාරක ප්‍රචලිත කිරීම හා භාවිතය පිළිබද ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රයේ උපදේශකවරුන්ගේ ධාරිතා වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය විද්වත් දේශක මණ්ඩලයක සහභාගීත්වයෙන් මාර්ගගත ක්‍රමයට ස්වභාවික ශීතකාරක මඟින් ක්‍රියාකරන ශීතකරණ හා වායු සමන පද්ධති හා නව තාක්ෂණ ක්‍රමවේද පිළිබඳව වැඩමුළු පවත්වන ලදී.



# ස්වයං ප්‍රතිචක්‍රීකරණය

කෘත්‍රිම ශීතකාරකයන් වායුගෝලයට මුදාහැරීම මඟින් ස්ථර ගෝලයේ ඇති ඕසෝන් ස්ථරය ක්ෂය වීමට හේතු වන අතර ගෝලීය උණුසුම ඉහළ යාම කෙරෙහිද දායකවේ. ඒ නිසා ස්වභාවික ශීතකාරක අඩංගු ශීතකරණ හා වායුසමන උපකරණයන් මෙම කර්මාන්තය වෙත හඳුන්වාදී ඇත. කෙසේ වෙතත් නව රෙගුලාසි වලට අනුව, ශීතකරණ හා වායුසමන වැඩපලක් පවත්වාගෙන යාම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර ආරක්ෂණ බලපත්‍රයක (EPL) ලබාගතයුතු වේ. මෙම බලපත්‍රය ලබා ගැනීම සඳහා ශීතකරණ හා වායුසමන කාර්මිකයින් අදාළ උපකරණයන් අළුත්වැඩියා කිරීම්වලදී ශීතකාරකය වායුගෝලයට මුදා නොහැර, ශීතකාරක එකතු කර ගත හැකි වනසේ තමාගේම ශීතකාරක එකතු කර ගැනීමේ යන්ත්‍රයක් හා නැවත භාවිතා කලහැකි ශීතකාරක එකතු කර ගැනීමේ සිලින්ඩර තිබිය යුතුය. එවිට එම ශීතකාරකයන් පිරිපහදු කිරීමෙන් (ප්‍රතිචක්‍රීකරණය කිරීමෙන්) පසුව නැවත භාවිතයට ගත හැකිය.

පරිසර අමාත්‍යාංශයේ  ජාතික ඕසෝන් ඒකකය මගින් මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධානයන්ට අනුකූලව පරිසර හිතකාමී හරිත තාක්ෂණය හඳුන්වා දී ඇත. ඒ සඳහා කාර්මික ශිල්පීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් ජාතික මට්ටමින් පවත්වයි. මෙම පුහුණුවේ කොටසක් ලෙසට ශීතකාරක එකතු කරගැනීම අඩු වියදම් සඳහා ශීතකාරක එකතුකර ගැනීමේ යන්ත්‍ර සැකසීම සඳහා උපදෙස් හා තාක්ෂණ සහය ලබා දෙනු ලබයි. **R22 ශීතකාරක ඉදිරියේදී ආනයනය කිරීම සීමාවන බැවින් ඒ හරහා එහි මිල ගණන් ඉහල යා හැකි අතරම වෙළඳපොල තුල අඩ සැපයුමක්ද පැවතිය හැක. එමෙන්ම HFC මූලික කරගත් R 134a වැනි ශීතකාරක ආදියද භාවිතය අවම කිරීමට කටයුතු කරන නිසා ශීතකාරක නැවත එකතුකර භාවිතා කිරීම ඉතා අත්‍යවශ්‍ය කටයුත්තකි.**

ඉහත ගැටළු වලට පිලියමක් ලෙස එකතු කරගන්නා ලද ශීතකාරක ස්වයං ප්‍රතිචක්‍රීකරණයකට යොමු කිරීම සිදු කල හැක. එය ඉතා සරල ක්‍රමයක් වන අතර ප්‍රතිචක්‍රීකරණය මධ්‍යස්ථානයකට නොගොස් තමාගේම වැඩ හල තුල මෙම ක්‍රියාව සිදු කරගත හැක. එකතු කරගන්නා ලද ශීතකාරක හා ජලවාෂ්ප, තෙල්, ද්‍රවීකරණය නොවන වායූන් ආදිය කලාපයන් දෙකක් ලෙසට සිලින්ඩරය තුල පවතී. එය ද්‍රව හා වාෂ්ප වශයෙනි. ද්‍රව පෘෂ්ඨය මත තෙල් කොටස් පාවෙමින් පවතී. වාෂ්ප කලාපය තුල පෙරකී අපද්‍රව්‍ය ,ජල වාෂ්ප හා ද්‍රවීකරණය නොවූ වායුවන් අඩංගුවේ. ද්‍රව නොවන වායූන්ට වඩා ශීතකාරක වාෂ්පය බරින් වැඩිය. ඒ අනුව පහත ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් එකතු කර ගන්නා ලද ශීතකාරකය ස්වයං ප්‍රතිචක්‍රීකරණයකට ලක්කල හැක.

1. නැවත භාවිතා කලහැකි බාහිර සිලින්ඩරයක් වෙතට ශීතකාරකය එකතු කර ගන්න.(එක සිලින්ඩරයක් තුල වෙනත් වර්ගයේ ශීතකාරක මිශ්‍ර නොවීමට සහතික වන්න.)

2. රික්ත කර ගත් නැවත භාවිතා කලහැකි ආකාරයේ සිලින්ඩරයක් ගන්න.

3. මෙම සිලින්ඩර දෙක ආරෝපණ නලයක් ගෙන එකිනෙක සම්බන්ධ කර ගන්න. එහිදී එකතු කරගත් ශීතකාරක සිලින්ඩරයේ ද්‍රව මාර්ග කපාටය දෙවන සිලින්ඩරයේ වාෂ්පය සඳහා වූ කපාටය වෙතට සවිකර ගත යුතුයි. එනම් දෙවන සිලින්ඩරයට ශීතකාරක ද්‍රව පමණක් යන බවට සහතික විය යුතුයි. කපාටයන් විවෘත කර එකතු කරගත් සිලින්ඩරයේ සිට දෙවන සිලින්ඩරයට ශීතකාරකය ගමන් කිරීමට සලස්වන්න. මෙය තාක්ෂණ ශිල්පීන් විසින් ඉතා ප්‍රවේශමෙන් කලයුතුය. එනම් ද්‍රව ශීතකාරකය පමණක් දෙවන සිලින්ඩරයට යා යුතුය.

4. දැන් දෙවන සිලින්ඩරයේ ඇති ශීතකාරකය බොහෝ දුරට අළුත් ශීතකාරකයක් හා සමාන තත්වයේ පවතින බැවින් පද්ධති සඳහා ආරෝපණය කිරීමට එම ශීතකාරකය නැවත භාවිතා කල හැක.



# ජගත් ඕසෝන් දින ජාතික උත්සවය - 2021





වර්තමාන කොවිඩ් තත්වය හමුවේ 2021 ජගත් ඕසෝන් දිනය සඳහා වූ ජාතික උත්සවය 2022 සැප්තැම්බර් 16 දින **" මොන්ට්‍රියල් සන්ධානයඃ අපව, අපගේ ආහාර සහ එන්නත් සිසිල්ව තබයි"** යන ගෝලීය තේමාව පෙරදැරි කරගනිමින් ගරු පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාගේ සහ පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය අනිල් ජාසිංහ මහතාගේ සහභාගීත්වයෙන් සූම් (ZOOM) තාක්ෂණය ඔස්සේ මාර්ගගතව පැවැත්විණි.

මෙම උත්සවයේ ප්‍රධාන අංගය වූයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා උපදේශක වෛද්‍ය මංජුල කාරියවසම් මහතා සහ ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු මෙන්ම උපදේශකවරයෙකු වන ඉංජිනේරු පියසිරි කළුබෝවිල මහතා විසින් පවත්වන ලද, ශ්‍රී ලංකාවේ එන්නත් සිසිලන දාමය, එහි අවශ්‍යතා සහ අභියෝග පිළිබඳ විද්වත් සංවාදයයි.




**බීජ බෝල සංකල්පය හඳුන්වාදීම**




ගෝලීය උණුසුම ඉහළ යාමේ බලපෑම අවම කිරීම සඳහා ඕසෝන් දිනයට සමගාමීව "බීජ බෝල සංකල්පය" හඳුන්වාදෙන ලදී. බීජ බෝල විසිරවීම යනු ශාක හා වනාන්තර වැඩීමට සහ හායනයට ලක් වූ ඉඩම් ප්‍රතිස්ථාපනය කිරීමට ආධාර කිරීම සඳහා වූ දේශීය ක්‍රමයකි.

2021 ජගත් ඕසෝන් දින ජාතික උත්සවයට සමගාමීව බීජ බෝල සැකසීම හා බෙදා හැරීම මඟින් සෑම වයස් කාණ්ඩයකටම අයත් සියළු පසුබිම් තලයන් නියෝජනය කරනු ලබන පුද්ගලයින් හරිතකරණය කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීමට හැකියාව ලැබේ. ජාතික ඕසෝන් ඒකකය ඇහැළ, මදටිය, සියඹලා වැනි සකස් කල බීජ බෝල 100,000 ක් බෙදා හැරීම තුළින් කාබන් උදාසීන කිරීම සඳහා ශ්‍රී ලංකාව ගන්නා වූ උත්සාහයට දායකවීමට තීරණය කර තිබේ.



## "මොන්ට්‍රියල් සන්ධානය: අපට අපගේ ආහාර සහ එන්නත් සිසිල්ව තබයි"

සෑම වසරකම ජගත් ඕසෝන් දින සැමරුම් උත්සවයට සමගාමීව විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවනු ලබයි. මෙම වසරේදී පාසල් සිසුන්, විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්, බාලදක්ෂ සාමාජිකයින් හා කාර්මික අධ්‍යාපන ආයතන වල පුහුණු කාර්මිකයින් සඳහා හරස් පද ප්‍රහේළිකා තරඟ මාලාව, ඕසෝන් කෙටි පිටපත් රචනා තරඟය, ඕසෝන් පෝස්ටර් නිර්මාණය හා "ඕසෝන් මිතුරු" ලාංඡන හඳුන්වාදීමේ සංකේත සැලසුම් කිරීම වැනි තරඟ පැවැත්විණි.

# ජයග්‍රාහි නිර්මාණ






















# ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය විමෝචනය කිරීමෙන් ආරක්ෂා කිරීම හා ගෝලීය උණුසුම අවම කිරීම සඳහා වෘත්තීය හා කාර්මික අධ්‍යාපනය ඉතා වැදගත් සාධකයකි

දශක කිහිපයක කාලාන්තරයක් තුල ශීතකරණ ක්ෂේත්‍රයේ පැවති තත්ත්වයන්ගේ විශාල ලෙස වර්ධනය වීමක් අදවන විට දක්නට හැකිය. මෙම අතිමහත් වර්ධනය සාධක කිහිපයක ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකිය. පළමු හා ප්‍රමුඛතම හේතුව නම් ඉතා සියුම් නිෂ්පාදන ක්‍රමවේදයන්ගේ සංවර්ධනය වීමත්, එමඟින් ඉතා කුඩා, වඩා කාර්යක්ෂම සහ බලශක්තිය ඉතිරිකරගත හැකි උපකරණයන් නිෂ්පාදනය කිරීමටත් හැකිවීමය. ආරක්ෂිත සහ පරිසර හිතකාමී ශීතකාරක වල සංවර්ධනය වීමද අනෙක් සාධකය විය. ඒ නිසා ශීතකරණ හා වායුසමනයන්, කර්මාන්තමය, වානිජමය, ප්‍රවාහනයේ, නාවික හා ගෘහස්ථ යොදාගැනීම් සඳහා වැඩි වශයෙන් භාවිතා විය. මෙම ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රයේ යොදාගැනීම්වල වේගවත්ව ප්‍රචලිත වීමේ ප්‍රතිඵලයක් ලෙසට, බොහෝ තරුණ කොටස් ඔවුන්ගේ අනාගත වෘත්තීය අපේක්ෂාවන්ට ගැලපෙන අයුරින්, තම තෘතීයික අධ්‍යාපනය සඳහා ශීතකරණ හා වායුසමන වෘත්තීය තෝරා ගැනීමට වැඩි කැමැත්තක් දක්වා ඇත.

සීඝ්‍රයෙන් වර්ධනය වන සහ වෙනස්වන නව තාක්ෂණයන්ට අනුව අපගේ දැනුම හා කුසලතාවයන්ද යාවත්කාලීන කිරීමට අප හට සිදුව ඇත. ශීතකරණ හා වායුසමන කර්මාන්තය ගැන සලකා බලනවිට 1950-1980 පමණ කාල වකවානුව තුල එතරම් සැලකිය යුතු වෙනසක් මෙම ක්ෂේත්‍රයේ දක්නට නොලැබුණි. ශීතාගාර, අයිස් නිපදවීමේ යන්ත්‍රාගාර, සමහර හෝටල් ආදී කර්මාන්තමය හා වාණිජමය ක්ෂේත්‍රයේ ශීතකරණ හා වායුසමනයන් හි යොදාගැනීම් සීමා සහිත වීම ඊට හේතුවිය. එමනිසා, ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රයේ තාක්ෂණික පුහුණු වැඩසටහන් වලද එතරම් වෙනස්වීම් දක්නට නොලැබුණි. කෙසේ වෙතත් ශ්‍රී ලංකාව තුල විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වාදීමෙන් පසු මෙම ක්ෂේත්‍රයේ සීමාවන් ඉක්මනින් වර්ධනය වීමට ආරම්භ කරන ලදී. විෂ සහිත මෙන්ම, ගිනිගැනීමේ හැකියාව සුළුවෙන් පවතින ඇමෝනියා වැනි ශීතකාරකයන් වෙනුවට CFC HCFC ශීතකාරක අඩංගු ශීතකරණ හා වායුසමන උපකරණයන් භාවිතයට කටයුතු කෙරිණ. ඒ නිසාම මිනිසා විසින් නිපදවන ලද, මෙම ආරක්ෂිත මෙන්ම ගිනිනොගන්නා සුළු, විෂ රහිත රසායනික ලක්ෂණයන් යුතුව CFC හා HCFC ශීතකාරකයන් බෙහෙවින් ජනප්‍රිය විය.

මොන්ට්‍රියල් සන්ධානයේ ගිවිසුම්වලට අනුව ශ්‍රී ලංකාව ද HCFC ශීතකාරකය (R 22) භාවිතයෙන් ඉවත්කිරීම සඳහා කටයුතු සැලසුම් කර ඇත. දැනටමත් HCFC ශීතකාරකයන් සමඟ කටයුතු කරන බොහෝ කර්මාන්තයන් මෙන්ම කාර්මික ශිල්පීන්ද මෙම වෙනස්වීම් සඳහා යම් පමණකට එකඟවෙමින් සිටී. එම නිසා HCFC ඉවත් කිරීමේ කාලරාමුවට අනුව ජාතික ඕසෝන් ඒකකය (NOU) මඟින් පුහුණුකරුවන් පුහුණුකිරීම සහ තාක්ෂණ ශිල්පීන් හා පුහුණුවන්නන් පුහුණු කිරීමේ වැඩසටහන් සූදානම් කරනු ලබයි. ඒ සඳහා HCFC ඉවත් කිරීමේ කළමනාකරණ වැඩ සටහන (HPMP) හරහා එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP) මඟින් සහාය ලබාදෙන අතර ,ශීතකාරක එකතුකර ගැනීම සඳහා ප්‍රතිපත්ති හා නීති රෙගුලාසි සැකසීම, විකල්ප ශීතකාරක පිළිබඳ මූලික කරුණු ඇතුලත් වනසේ සැකසූ විෂය මාලාවකින් සමන්විත **"ශීතකරණ කටයුතු වලදී හොඳ පුරුදු"** මැයෙන් පුහුණු වැඩසටහන් පවත්වනු ඇත.

මේ පුහුණුකිරීමේ ක්‍රියාකාරකම් පිළිබඳව පහත සඳහන් පරිදි දැක්විය හැක.

- ශීතකරණ පරිපථ සෝදාහැරීමේ කාරකයන්, තාප පරිවාරක සෑදීමේදී පෙණගැන්නුම් කාරකයන් හා ද්‍රාවකයන් ද ඇතුළුව ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රයේ දී භාවිතා කරනු ලබන ඕසෝන් ප්‍රහීනකාරක ද්‍රව්‍යයන් සහ ගෝලීය උණුසුම කෙරෙහි දායක වන ද්‍රව්‍යයන් පිළිබඳව එම අංශයන්හි නියුතුව කටයුතු කරන කාර්මික ශිල්පීන් හා පුහුණුවන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- ශීතකාරක එකතු කරගැනීම, ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍යයන් සහ නැවත සැකසීම පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික වැඩමුළු පැවැත්වීම.

- ශීතකරණ හා වායුසමන ශිල්පීන් හට එදිනෙදා තම වැඩකටයුතු / වැඩහල් වලදී අළුත්වැඩියා හා සේවා කටයුතු කිරීමේ භාවිතාව සඳහා අඩු වියදම් ,ශීතකාරක එකතු කර ගැනීමේ යන්ත්‍ර සැකසීම පිළිබඳව තාක්ෂණික සහාය සැපයීම. මේ අනුව බොහෝ කාර්මික ශිල්පීන් HCFC හා HFC ශීතකාරකයන් වායුගෝලයට විමෝචනය කිරීමෙන් තොරව එක්රැස්කර ගන්නා අතරම එමඟින් පරිසරය ආරකෂාව මෙන්ම ආර්ථිකමය වාසිද ඔවුනට ලැබෙනු ඇත.



■ පරිසර හිතකාමී ශීතකරණ හා වායුසමන කාර්මික ශිල්පීන්/ පුහුණුවන්නන් බිහිකිරීමේ අරමුණින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් ද ඇතුළුව **"ශීතකරණ හා වායුසමන කටයුතු වලදී හොඳ පුරුදු"**මැයෙන් දින එකක/තුනක තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම.

■ වර්තමානයේ බොහෝ දෙනෙක් පරිසර හිතකාමී මෙන්ම බලශක්ති කාර්යක්ෂමතාවය සහිත දියුණු ශීතකරණ උපකරණයන් කෙරෙහි විශේෂයෙන් ගෘහස්ථ ශීතකරණ වැනි උපකරණයන් භාවිතයට වැඩි කැමැත්තක් දක්වයි. ඒ නිසාම R 600a වැනි හයිඩ්‍රොකාබන් ශීතකාරක පිළිබඳව හඳුන්වාදීම සහ ඒවා ආරක්ෂිතව භාවිතාකරන ආකාරය පිළිබඳව තාක්ෂණ ශිල්පීන්ව පුහුණු කිරීම.

■ ශ්‍රී ලංකාවේ වෘත්තීය හා කාර්මික පුහුණු ආයතනයන්හි සේවය කරන ශීතකරණ හා වායුසමන පුහුණුකරුවන් /උපදේශකවරුන් හට පරිසර හිතකාමී මෙන්ම ගෝලීය උණුසුම් විභවය අඩු උපකරණ භාවිතය පිළිබද නව තාක්ෂණය හා ශීතකරණ පද්ධතීන් වන ලිතියම් බ්‍රෝමයිඩ් අවශෝෂණ ක්‍රමය හා ඇමෝනියා (R717) ශීතකරණ පද්ධති පිළිබඳව පුහුණුකරුවන් පුහුණුකිරීමේ (TOT) වැඩසටහන් පැවැත්වීම.

මෙම පුහුණු වැඩසටහන්වල තවත් ඉදිරි පියවරක් ලෙසට R 22 ශීතකාරකය භාවිතා කරන වායු සමන යන්ත්‍ර මඟින් ඇතිවන ගෝලීය උණුසුම අවම කිරීමට දායකවන එමෙන්ම පරිසර හිතකාමී තාක්ෂණයන්ට යොමුවෙමින් විකල්ප ශීතකාරකයන් ලෙසට R 32 ශීතකාරකය යොදා ගනු ලබන ඉන්වර්ටර් තාක්ෂණය (Inverter Technology) සහිත වායුසමන යන්ත්‍ර පිළිබඳව පුහුණු වැඩසටහන් පවත්වනු ඇත.

ශ්‍රී ලංකාව තුල වෘත්තීය හා කාර්මික පුහුණු ආයතන හා පුහුණු මධ්‍යස්ථාන වැඩිවීමත් සමඟ වැඩි වශයෙන් ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රයේ තාක්ෂණ ශිල්පීන් හා පුහුණුවන්නන් බිහිවීමේ ප්‍රමාණයද වැඩිවේ. එමනිසාම මෙම ක්ෂේත්‍රයේ පුහුණු වැඩසටහන් නොකඩවා පැවැත්වීමේ අවශ්‍යතාවයක් ඇති බැවින් මෙන්ම එය අත්‍යාවශයෙන්ම කලයුතු කාර්යයක්ද වේ. මක්නිසාද යත් ඔවුන් පුහුණුව නිම කිරීමෙන් පසු සුදුසුකම් ලත් තාක්ෂණ ශිල්පීන් ලෙස ආයතන වලින් පිටවන බැවින් අනාගතයේදී ඔවුන්ගෙන් විශාල දායකත්වයක් මෙම ක්ෂේත්‍රය සඳහා දක්වන බැවිනි.

**පුහුණුකරුවන් ලෙස අප සතු කාර්යභාරයන් වන්නේ, ඔවුන් ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රයේ වැඩකටයුතු කිරීමට හා එමඟින් ආදායම් ඉපැයීමට හැඩගැස්සවීමට අමතරව පරිසරය කෙරෙහි සංවේදී පුද්ගලයන් බවට පත්කර සමාජගත කිරීමයි. එමඟින් ඔවුන් සිදුකරන කටයුතු හරහා ඕසෝන් ස්ථරය හායනය වීම හා ගෝලීය උණුසුම වැඩිවීමෙන් ආරක්ෂා කරගත හැකි අතරම අපගේ අනාගත පරපුරට වඩාත් හොද පරිසරයක් නිර්මාණය කිරීමෙහි ලා ඔවුන් පරිසර හිතකාමී පුරුදු සහිත පාර්ශවකරුවන් බවට පත්කිරීමට හැකිවනු ඇත.**



# ඔබ ශීතකරණ හා වායු සමන සේවා හා නඩත්තු ක්ෂේත්‍රයේ කාර්මිකයෙක්ද ?

ශීතකරණ හා වායු සමන සේවා හා නඩත්තු (Service and Maintenance) සිදුකිරීමේදී වායුගෝලයට මුදාහරින ශීතකාරක (Refrigerant/ Gas) ප්‍රතිචක්‍රීකරණය කර නැවත භාවිතා කිරීමෙන් ඔබට විශාල ආර්ථික ප්‍රතිලාභයක් මෙන්ම ඔබගෙන් පරිසරයට හා මිහිමත සිටින සියළු ජීවීන්ට මිල කළ නොහැකි සේවයක් සිදුවන බව දන්නවාද ?

**ඔබත් පරිසර හිතකාමී කාර්මිකයෙකු වන්න**
**අදම ශීතකාරක එක්රැස් කිරීම සඳහා යොමුවන්න.**

ඔබ එක්රැස් කරගනු ලබන ශීතකාරක පහත දක්වා ඇති මධ්‍යස්ථාන වෙතින් ප්‍රතිචක්‍රීකරණය කරගත හැකිවනු ඇත.

| | | |
|---|---|---|
| 1. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, මොරටුව | - | දුරකතන අංක 0112605625 |
| 2. තාක්ෂණ විද්‍යාලය, ගාල්ල | - | දුරකතන අංක 0912234051 |
| 3. විදුලිබල මණ්ඩලය, කොළොන්නාව | - | දුරකතන අංක 0112533581 |
| 4. තාක්ෂණ විද්‍යාලය, මඩකලපුව | - | දුරකතන අංක 0652246557 |
| 5. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල | - | දුරකතන අංක 0572231548 |
| 6. කාර්මික විද්‍යාලය, පොළොන්නරුව | - | දුරකතන අංක 0272224429 |
| 7. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, වව්නියා | - | දුරකතන අංක 0242221617 |
| 8. වයඹ තාක්ෂණ විද්‍යාලය, කුරුණෑගල | - | දුරකතන අංක 0373377033 |
| 9. කාර්මික විද්‍යාලය, ගම්පහ | - | දුරකතන අංක 0332222132 |


උපදේශකත්වය:
වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
පරිසර අමාත්‍යාංශය

ඒ.ඩබ්.එම්. රිෆා වදූද්
අධ්‍යක්ෂ (වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය)
පරිසර අමාත්‍යාංශය

පී.එම්.එම්.එස්. තිලකරත්න
සහකාර අධ්‍යක්ෂ (වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය)
පරිසර අමාත්‍යාංශය

සංස්කාරක:
එම්.එල්. යෝගිතා රනුලි ලියනගේ
සංවර්ධන නිළධාරි
(වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය)
පරිසර අමාත්‍යාංශය

මුද්‍රණය:
ඊ පී ඒ ඇඩ්වර්ටයිසින්,
185, කළපළුවාව පාර,
කොස්වත්ත, බත්තරමුල්ල.

ප්‍රකාශනය
වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය
පරිසර අමාත්‍යාංශය
"සොබාදම් පියස", 416/C/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල
දුරකතන අංක: 0112034221 / 0112879974
විද්‍යුත් තැපෑල: noulanka@gmail.com
www.env.gov.lk / www.nou.lk